**පරන්තන් කෙමිකල් සමාගම - 2018**

**------------------------------------------------------**

**මතය**

**-----**

පරන්තන් කෙමිකල් සමාගමේ2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2018දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.1 මතය සඳහා පදනම**

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතයසඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.3 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.4 මූල්‍ය ප්‍රකාශන

--------------

### 1.4.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

| විගණන නිරීක්ෂණය<br>-------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>---------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා ගෙවීම, පාරිතෝෂිත විශේෂ දීමනාව ගෙවීම වැනි විශේෂ ගෙවීම්වලදී අභ්‍යන්තර විගණනය විසින් අදාල ගෙවීම නිවැරදි බවට තහවුරුවක් සිදුකර නොතිබුණි. | ගෙවීම නිවැරදි බවට තහවුරු කිරීම සඳහා අභ්‍යන්තර විගණක දැනුවත් කළ බව | ගෙවීම නිවැරදි බවට තහවුරුවක් ගත යුතුයි |

### 1.4.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 8 ප්‍රකාරව මුළුමනින්ම ක්ෂය වී ඇති රු 22,353,215 ක වටිනාකම සහිත වූ වාහන සඳහා ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි. | වාහන සඳහා 2019 වර්ෂයෙදී ප්‍රත්‍යාගණනයක් නැවත සිදුකරන බව | ප්‍රත්‍යාගණනයක් කළ යුතුය. |

### 1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2000 වර්ෂයේ සිට ජලසම්පාදන මණ්ඩලයෙන් අයවියයුතු රු1,387,445 ක් වූ ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කර ගැනීමට ලිපි යවා ඇති බව | ණය ශේෂය නිරවුල් කළ යුතුයි. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 570 හා 571 | 2001 වර්ෂයේ සිට පැවත එන රු 17,930,000ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගෙන නොතිබුණි. | ණය හිමියන්ට ලිඛිතව දන්වා ඇති බව | ණයශේෂ නිරවුල් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2003 ජුනි 03 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය<br>(i) 5.2.4 වගන්තිය | මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස තුනකට පෙර කෙටුම්පත් අයවැය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 වර්ෂයේ අයවැය ඉදිරිපත් කර ඇත්තේ 2017 දෙසැම්බර් 27 දිනදීය. | 2019 වර්ෂයේ සිට මාස 3 කට පෙර විගණන කමිටුවට ඉදිරිපත් කරන බව | නියමිතකාල යතුළ අයවැය ඉදිරිපත් කළ යුතුය. |
| | (ii)8.2.3 වගන්තිය | ඉකුත් වර්ෂවලදී තැන්පත් කල රු.314, 962,683 ක් වූ ස්ථාවර තැන්පතු සඳහා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | භාණ්ඩාගාර අනුමැතිය ප්‍රමාද වී ඇති බව | අදාල අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 2015/01 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 වගන්තිය | නිලධාරීන් 4 දෙනෙකු සඳහා රු 15,000 බැගින් වූ ප්‍රවාහන දීමනාවක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් ලබාදී තිබූ අතර, මේ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි | අනුමැතිය ලබාගැනීම සඳහා 2019 වර්ෂයේදී කටයුතු කරන ලබන බව | චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 74,263,916 අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 99,899,337 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.25,635,421 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විකුණුම් ආදායම අඩුවීම හා පරිපාලන වියදම් ඉහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

| ආදායම | 2017 | 2018 | විචලනය | |
|---|---|---|---|---|
| | රු | රු | රු | % |
| ක්ලෝරීන් | 273,449,500 | 267,390,350 | 6,059,150 | 2 |
| කෝස්ටික් සෝඩා පතුරු | 58,697,350 | 32,510,719 | 26,186,631 | 44 |
| කෝස්ටික් සෝඩා දියර | - | 156,930 | 156,930 | 100 |
| හයිඩොක්ලෝරික් ඇසිඩ් | 2,757,480 | 2,549,196 | 208,284 | 7 |
| බ්ලීචින් දියර | 1,989,517 | 20,450 | 1,969,067 | 99 |
| එකතුව | **336,893,847** | **302,627,645** | **34,580,062** | **10** |

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම්වල සමස්ත අඩුවීම සියයට 10ක් පමණක් වුවද එක් එක් රසායන ද්‍රව්‍ය වෙන් වශයෙන් සලකා බැලීමේදි ක්ලෝරීන් හැර අනෙකුත් රසායන ද්‍රව්‍ය අලෙවියේ සීඝ්‍ර අඩුවීමක් නිරීක්ෂණය වේ. සමාගමේ රසායන ද්‍රව්‍ය දෙකක නිෂ්පාදන කටයුතු අසාර්ථක වීම එයට හේතුවී තිබුණි.

**2.3 අනුපාත විශ්ලේෂණය**

| අනුපාතය | 2017 | 2018 |
|---|---|---|
| ජංගම අනුපාතය | 1:6 | 1:8 |
| දල ලාභ අනුපාතය | 51% | 48% |

ජංගම වත්කම් අනුපාතය ඉහල අගයක් ගෙන ඇත්තේ ජංගම වත්කම් තුළ කෙටිකාලීන ස්ථාවර තැන්පතු ඇතුළත් විම නිසා වන අතර, විකුණුම් ආදායම අඩුවිම දළ ලාභ අනුපාතය අඩුවීමට හේතුවී තිබේ.

**3. මෙහෙයුම් සමාලෝචන**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1955 වර්ෂයේ සිට සමාගමේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබයි. 2015 වර්ෂයේ සිට වාර්ෂික බදු පදනමට අධිකාරිය සමඟ ගිවිසුම් ගතවී තිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි යටතේ රු 6,350,000 ක ඇස්තමේන්තු වටිනාකමක් දක්වා තිබුණි. ගොඩනැගිල්ලේ අයිතිය සමාගම සතුව නොතිබියවදී 2017 හා 2018 වර්ෂවලදී රු 12,509,678 ක අළුත්වැඩියා වියදම් දරා තිබුණි. | ඉඩම ලබාගැනිම සඳහා අමාත්‍යාංශ මට්ටමින් කටයුතු කරන බව | අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුය |

## 3.2 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **<u>පරන්තන් කම්හල නැවත ආරම්භ කිරීම</u>**<br><br>1986 වසරේ සිට පරන්තන් නිෂ්පාදනාගාරයේ ක්ලෝරීන් නිෂ්පාදනය නවතා දැමීමට සිදුවීම හේතුකොට ගෙන මෙරටට අවශ්‍ය කෝස්ටික් සෝඩා හා ක්ලෝරීන් සැපයීම මුලුමනින්ම ආනයනය මත රඳා පැවතී තිබුණි. පරන්තන් කර්මාන්ත ශාලාව ආරම්භ කිරීම සඳහා අක්කර 227 ක් වන භූමියක් වෙන්කර ඇති නමුත් විගණිත දින වන විටත් කම්හල ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි. අක්කර 20 ක භූමි ප්‍රමාණයක වාණිජමය වශයෙන් වටිනා ශාක සිටුවීමට කටයුතු කර ඇති අතර, ඒ වෙනුවෙන් 2016, 2017 හා 2018 වර්ෂ වලදී පිළිවෙලින් රු.2,552,730ක, රු.433,435ක හා රු.631,680ක වියදමක් දරා තිබුණි. | කම්හල නැවත ආරම්භ කිරීම සඳහා විශාල ආයෝජනයක් මෙන්ම පාරිසරික ප්‍රමිතීන්ට ගැළපෙන තාක්ෂණයක් අවශ්‍ය වන බවත්, දැනට රජයේ නව යෝජනාවක් පරිදි පරිසර හිතකාමී කාර්මික කලාපයක් පිහිටුවීමට සැලැසුම් කිරීම සඳහා යෝජනා සකස් කරන බව | ක්ලෝරීන් නිෂ්පාදනය ආරම්භ කළ යුතු බව |
| **<u>කොස්ටික් සෝඩා දියර නිෂ්පාදන ව්‍යාපෘතිය</u>**<br>2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු.3,279,994ක් වැය කර කොස්ටික් සෝඩා දියර නිෂ්පාදන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණද, කිසිදු නිෂ්පාදනයක් හා අලෙවියක් මේ දක්වා සිදුකර නොතිබුණි. නිෂ්පාදනය සඳහා සකස් කර තිබූ ටැංකි සහ නළ විගණිත දිනය වනවිට නිෂ්පාදන කටයුතු සඳහා නුසුදුසු මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | නිෂ්පාදනයක් ලබාගතහැකි වුවත්, තරඟකාරිත්වය මත වෙළඳපොල සොයාගැනීමට නොහැකි බව හා වෙළඳපොලට ගැළපෙන ගුණත්වය නොමැති බව | ගුණාත්මකනිෂ්පාදන යක් සිදු කොට වෙළඳපොළ සොයාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.9 ප්‍රසම්පාදන කළමනාකරණය**

---------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෝස්ටික්සෝඩාදියරනිෂ්පාදනයහාවිකිණීමසඳහාකෝස්ටික්සෝඩාපතුරු කිලෝ ග්‍රෑම් 25 ක් බැගින් වූ බැග් 5,000ක් 2018 වර්ෂයේදී මිලදී ගෙන, එයින් 2018 දෙසැම්බර් 31 දිනට බැග් 2,087ක් විකිණීමට හෝ නිෂ්පාදනයට යොදා නොගෙන ගබඩා කර තිබුණි. ඉන් 2019 අප්‍රේල් 23 දිනට කෝස්ටික් සෝඩා බැග් 1,059 ක් භාවිතයට නොගෙන තිබුණ අතර එම තොගය කල් ඉකුත්වන දිනය 2019 අප්‍රේල් මාසයේ විය. | අලෙවි අංශයේ ඉල්ලීම අනුව මිලදී ගත්තද දේශීය වෙලඳ පොලේ මිල අඩුවීම නිසා අලෙවි කර ගැනීමට නොහැකිවූ බව | නිෂ්පාදනය හා විකිණීමට ඇති හැකියාව පිළිබඳව සැලකිලිමත් වී මිලදී ගැනීම් සිදුකළ යුතුය |
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.1 මාර්ගෝපදේශය ප්‍රකාරව දේශීය සැපයුම්කරුවන්ගේ හැකියාව සීමිත වන විට ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමක් සිදුකළ යුතු වුවත්, ක්ලෝරීන් ආනයනයේදී ජාතික තරඟකාරී ලංසු ක්‍රමය අනුගමනය කරමින් විදේශ සමාගම්වල දේශීය නියෝජිතයන් මඟින් මිල කැඳවීම් කර තිබුණි. ඒ අනුව දේශීය නියෝජිතයන් කිහිපදෙනෙකු හරහා මෙම ගනුදෙනු වාර්ෂිකව සිදුවන බව නිරීක්ෂණය විය. 2018 වර්ෂයේදී ක්ලෝරීන් ආනයනය කිරීම වෙනුවෙන් දේශීය නියෝජිතයන්ට ගෙවන ලද කොමිස් ප්‍රමාණය රු 14,332,650 ක් වී තිබුණි. නියෝජිත සැපයුම්කරුවන් සියළුම දෙනා විසින් එකම මිලක් ඉදිරිපත් කිරීම හේතුවෙන් මිලදී ගත යුතුප්‍රමාණය කොටස්කර සියලු දෙනාට සහභාගී වීමට හැකි වන පරිදි ලබා දීම සමාගම කටයුතු කර තිබුණි. ඒ අනුව ලංසුකරුවන් ඉදිරිපත් කරන මිල ක්ලෝරීන්වල ගැනුම් මිල වශයෙන් පිළිගැනීමට සමාගමට සිදු වී තිබුණි. | රසායන ද්‍රව්‍ය ගෙන්වීම සඳහා ද්විපාර්ශවික ගිවිසුමක් යටතේ මිලදීගැනීමට අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පවත්වන බව | ජාත්‍යන්තර ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කරමින් මිලදී ගත යුතු බව |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගම විසින් 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද එහි පහත ක්‍රියාකාරකම් යටතේ අපේක්ෂිත ඉලක්ක සපුරාගැනීම පිළිබඳ ප්‍රගතිය පිළියෙල කර නොතිබුණි.<br>• ජලසම්පාදන මණ්ඩලයට ක්ලෝරීන් ලබා දෙන මිල පවත්වා ගැනීම හා ණය සීමාව වැඩි කිරීම,නව ජල ව්‍යාපෘති සඳහා දියර ක්ලෝරීන් හඳුන්වාදීම,වෙනත්රසායනද්‍රව්‍යයොදාගන්නා කර්මාන්ත සඳහා ක්ලෝරීන් නිකුත් කිරීම, ගැණුම්කරුවන් සඳහා ආරක්ෂිත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි සැලැසුම් යටතේ ක්‍රියාත්මක කිරීම සැලැසුම් කර තිබුණද, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ජල සම්පාදන මණ්ඩලය සමඟ සාකච්ඡා පැවැත්වීම, නව ගැණුම්කරුවන් සොයා යාම, දැනුවත් කිරීම වැනි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2019 වර්ෂයේ සිටක්‍රියාකාරී සැලැස්මේඅපේක්ෂිත ඉලක්ක සපුරාගැනීමපිළිබඳ ප්‍රගතිය පිළියෙල කිරීමට ලිඛිතව උපදෙස් දුන් බව | ඉලක්ක සපුරාගැනීම හා සමාගමේ දැක්ම කරා ලඟාවීමට කටයුතු කළ යුතුය |
| • ප්‍රධාන රසායන ද්‍රව්‍ය 4 ක් ආනයනය කිරීම හා රසායන ද්‍රව්‍ය 2 ක් නිෂ්පාදනය කිරීමට සැලැසුම් කර තිබුණද, ක්ලෝරීන් ආනයනය හා අලෙවිය ආදායමෙන් සියයට 89 ක් වීමේ සමාගම ඒමත රඳාපවතින බව නිරීක්ෂණය විය.<br><br>රසායන ද්‍රව්‍ය නිෂ්පාදනයේ ප්‍රමුඛයා වීම හා දේශීය කර්මාන්ත සඳහා රසායන ද්‍රව්‍ය සැපයීම වශයෙන් වූ සමාගමේ දැක්ම කරා ලඟාවීමට නොහැකිවී තිබුණි. | අනෙකුත් රසායන ද්‍රව්‍ය සඳහා තරඟකාරි මිලගණන් යටතේ කටයුතු කිරීමට සිදුවී ඇති බව හා සමාගමේ මිලගණන් වැඩිවීම | |